සැලකිය යුතුයි: මෙම අත් පත්‍රිකාව විෂය පිළිබඳව පරිපූර්ණ හැඳින්වීමක් නොවේ.පාඨමාලාවට අදාළ මාතෘකාවන්හි ප්‍රධාන කරුණු පිළිබඳව උපාධි අපේක්ෂකයන්ට මඟපෙන්වන්නක් පමණක් වේ.

හැඳින්වීම :

ප්‍රථම ශාස්ත්‍ර පරීක්ෂණයට අදාළ දේශපාලන විෂයෙහි පළමු කොටස වන්නේ දේශපාලන විද්‍යාවේ මූලධර්ම පිළිබඳව මනා අවබෝධයක් ලබා ගැනීමයි.එහිදි පහත සඳහන් මාතෘකා යටතේ දේශනය සංවිධානය කරනු ලැබේ.

## 01)දේශපාලන විද්‍යාවේ ස්වභාවය හා විෂය ක්ෂේත්‍රය

දේශපාලන විද්‍යාවේ ස්වභාවය පිළිබඳව නිර්වචනයක් පිළිගැනීමක් නොමැත. විවිධ මතවාද පවතී. ඇතැමෙකුගේ මතය අනුව දේශපාලන විද්‍යාවේ ස්වභාවය වන්නේ රාජ්‍ය පිළිබඳ හැදෑරීමයි. තවත් අයෙකුගේ මතය වන්නේ බලය පිළිබඳ හැදෑරීමයි. මෙම පිළිගැනීම් දෙකේම එකතුවක් ලෙස දේශපාලන විද්‍යාවේ ස්වභාවය විස්තර කළ හැකිය.

විෂය ක්ෂේත්‍ර අන්තර්ගතය

1. රාජ්‍ය හා ආණ්ඩුව පිළිබඳ හැදෑරීම
2. දේශපාලන න්‍යාය හා සමාජ චින්තනය
3. දේශපාලන ආයතන පිළිබඳ හැදෑරීම
4. දේශපාලන ගතිකතාව පිළිබඳ හැදෑරීම
5. නීතිය-ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා නීතිය, පරිපාලන නීතිය සහ පොදු නීතිය
6. රාජ්‍ය පරිපාලනය, තුලනාත්මක පරිපාලන සහ සංවර්ධන පරිපාලන
7. පළාත් පාලන ක්‍රම
8. අන්තර්ජාතික දේශපාලනය, ජාත්‍යන්තර ආයතන සහ ජාත්‍යන්තර නීතිය
9. රාජ්‍ය ප්‍රතිපත්ති සම්පාදනය සහ ඒවා ක්‍රියාවට නැංවීම
10. දේශපාලන සමාජ විද්‍යාව
11. ගැටුම් කළමණාකරණය සහ නිරාකරණය

දෙවන ලෝක සංග්‍රාමයෙන් පසුව ව්‍යාප්ත වූ චර්යාවාදී අධ්‍යයන ක්‍රමය සමඟ දේශපාලන විද්‍යාවේ විෂය ක්ෂේත්‍රයට නවාංග රාශියක් එකතුවී ඇත. ඒවා නම්

1. දේශපාලන බලය
2. දේශපාලන චර්යාව
3. දේශපාලන ප්‍රභූන්
4. දේශපාලන සමාජානුයෝජනය හා දේශපාලන සංස්කෘතිය
5. පද්ධති විශ්ලේෂණ ක්‍රමය

6. දේශපාලන නවීකරණය හා දේශපාලන සංවර්ධනය

වර්තමානය වනවිට දේශපාලන විද්‍යාවේ විෂය ක්ෂේත්‍ර ප්‍රධාන කොටස් 04කට බෙදා දැක්විය හැකිය. න්‍යායාත්මක දේශපාලනයේදී වැදගත් වන්නේ දේශපාලනඥයින් සහ දේශපාලන පක්ෂ නොව දේශපාලන දාර්ශනිකයින්, දේශපාලන චින්තකයින් , දේශපාලන විද්‍යාඥයින් සහ ඔවුන් ඉදිරිපත් කර තිබෙන න්‍යායන්, මූලධර්ම හා මතවාද හා මතවාදයන්ය. මෙම අදහස් කොටස් හතරකින් සමන්විත වේ.

1. දේශපාලන න්‍යාය (Political Theory)
2. දේශපාලන චින්තනය (Political Thought)
3. දේශපාලන දර්ශනය (Political Philosophy)
4. දේශපාලන මතවාද (Political Ideology)

## (02)අධ්‍යයන ක්‍රමවේද

දේශපාලන විද්‍යාව අධ්‍යයනය කිරීම සඳහා භාවිතයට ගැනෙන ප්‍රවේශයන් ගණනාවක් තිබේ. ඒවා අතරින් දාර්ශනික ක්‍රමය , ඓතිහාසික මාර්ගය, තුලනාත්මක ක්‍රමය, සමාජ විද්‍යාත්මක ක්‍රමය සහ චර්යාවාදී ක්‍රමය වැදගත්වේ.

**දාර්ශනික ක්‍රමය**

දේශපාලන ආයතන දාර්ශනික සංකල්ප යොදා අධ්‍යයනය කිරීමේ ක්‍රමය දාර්ශනික ප්‍රවේශ ලෙස සැලකේ. එමගින් කරනුයේ සැබෑ වශයෙන් පවතින තත්ත්වයන් අධ්‍යයනය කිරීම නොව පැවැතිය යුතු යයි. කලින් සිතාගත් දාර්ශනික ඉහළ ආචාර ධර්මානුකූල සංකල්ප යොදා පරමාදර්ශයන් අධ්‍යයන කිරීමය.

**ඓතිහාසික ක්‍රමය**

දේශපාලන ප්‍රපංචයන් ඒවායේ ඓතිහාසික සාධකයන් ඇසුරෙන් ක්‍රමවත් ලෙස අධ්‍යයන කිරීම ඓතිහාසික ක්‍රමය ලෙස හැඳින්වේ. මේ මගින් රාජ්‍යය හා අනෙකුත් ආයතන්හි ප්‍රභවය, විකාශනය පිරික්සා බැලීමෙන් ඒවායේ ස්වභාවය හා ක්‍රියාකාරීත්වය අවබෝධ කර ඒවායේ වර්තමාන තත්ත්වයන් හා අනාගත ප්‍රවණතා අධ්‍යයන කිරීමට තැත් කරයි. දේශපාලන අධ්‍යයන කිරීම සඳහා ඉතාම හොඳ පර්යේෂණාගාරය ඉතිහාසයයි සැලකේ.

**තුලනාත්මක ක්‍රමය**

දේශාපාලන ක්‍රම සහ ආයතන එකිනෙක ගලපා තුලනාත්මක අධ්‍යයන කිරීම තුලනාත්මක ක්‍රමය ලෙස හැඳින්වේ. මේ ක්‍රමය යොදා දේශපාලන ක්‍රම හා ආයතන හදාරමින් ලබාගන්නා තොරතුරු පදනම් කොටගෙන හොඳ ආණ්ඩු ක්‍රමය ගොඩ නගා ගැනීම සඳහා වූ මූලධර්ම නිගමනය කෙරේ. මෙම ප්‍රවේශය තුළින් තුලනාත්මක දේශපාලනය යනු විෂය දේශපාලන විද්‍යාවේ ප්‍රචලිත වී ඇත.

**සමාජ විද්‍යාවේ විද්‍යාත්මක ක්‍රමය**

මෙය නූතන දේශපාලන විද්‍යාඥයන් අතර බෙහෙවින් ජනප්‍රිය වී ඇති ප්‍රවේශයකි. සමාජ සන්දර්භය ඇසුරින් දේශපාලනය හැදෑරීමේ ක්‍රමය සමාජ විද්‍යාත්මක ක්‍රමය ලෙස සැලකේ. මෙම ක්‍රමය මගින් දේශපාලනයේ සමාජ, ආර්ථික පදනම හා විවිධ දේශපාලන ආයතනයන්හි ක්‍රියාකාරිත්වය හැඩ ගස්වා ඒ කෙරෙහි බලපාන්නාවූ සමාජ හා අනෙකුත් සාධක විමසා බැලේ. මෙම ක්‍රමය මගින් දේශපාලන සමාජ විද්‍යාව යන විෂය අනුක්‍රමිකව දේශපාලන විද්‍යාවේ වර්ධනය වී ඇත.

**චර්යාවාදී ක්‍රමය**

මෙය නවතම, වැදගත් ප්‍රවේශයකි. දේශපාලනයෙහි නියෙලෙන පුද්ගලයන්ගේ හා පුද්ගල කණ්ඩායම් වල හැසිරීම හදාරා ඒ මගින් දේශපාලනය අවබෝධ කරගැනීමේ ක්‍රමය ලෙස චර්යාවාදී ක්‍රමය හැඳින්වේ. මෙම ක්‍රමය මගින් දේශපාලන ආයතනවල ව්‍යුහයන් කෙරෙහි නොව ප්‍රායෝගික තත්ත්වයන් කෙරෙහි අවධාරණය කරනු ලැබේ. එබැවින් දේශපාලන ආයතනයට හසුවන ප්‍රධාන කර්ථක දේශපාලන මිනිසාය.

## (03 ) පහත සඳහන් න්‍යායන් යටතේ රාජ්‍යයේ ප්‍රධාන ලක්ෂණ හඳුන්වා දිය හැකිය

1. ලිබරල් න්‍යාය
2. මාක්ස්වාදී න්‍යාය
3. ෆැසිස්ට්වාදී න්‍යාය

**i) ලිබරල් න්‍යාය.**

අ) රාජ්‍ය යනු පොදු සුභසිද්ධිය සඳහා වූ ආයතනයකි

ආ)අන් සංවිධාන අතරින් උත්තරිතර සංවිධානය වීම

ඇ)පෞද්ගලික නිදහස ආරක්ෂාවීම

ඈ) රාජ්‍යය මූලිකත්වයෙන් කටයුතු කිරීම

ඉ)මහජන මූලිකත්වයෙන් කටයුතු කිරීම

ඊ)නීතියේ ආධිපත්‍යයට මුල්තැන ලබාදීම

**ii)** මාක්ස්වාදී න්‍යාය

අ)රාජ්‍ය පංති උපකරණයකි

ආ)රාජ්‍ය බලය මහජනතාවගේ බලයට වඩා ඉහලින් පැවැතීම

ඇ) සමාජ සම්පත් අධික ලෙස ගිලදැමීම

ඈ)රාජ්‍යය බලය යම් නිශ්චිත භූමි ප්‍රදේශයක් සහ එහි ජිවත්වන මිනිසුන් වෙත යෙදවීම

ඉ) රාජ්‍යය සදාකාලික නොවන ආයතනයකි

**iii)** ෆැසිස්ට්වාදී න්‍යාය

අ) රාජ්‍යයේ උත්තරීතරභාවය හා රාජ්‍ය වන්දනය

ආ) ලිබරල් හා සමාජවාදී දර්ශන පිටුදැකීම

ඇ) ඒක පක්ෂ ක්‍රමය යටතේ ඒකාධිපති පාලනයක් පවත්වා ගෙන යාම

ඈ) ෆැසිස්ට් පක්ෂ මිස අනෙකුත් දේශපාලන සංවිධාන සහ න්‍යායන් ක්‍රියාත්මක වීම තහනම් කිරීම

ඉ) පුද්ගල නිදහස හා අයිවාසිකම් නොපිළි ගැනීම

ඊ)සමාජ අසමානතාව පිළිගැනීම

උ)බුද්ධිවිරෝධී බව

ඌ)ජාතිය ශ්‍රේෂ්ඨ ලෙස සැලකීම

එ) යුදකාමී බව

## 04) ව්‍යවස්ථානුකුලවාදය

ව්‍යවස්ථානුකුලවාදය යනු ව්‍යවස්ථානුකුල මූලධර්ම නාමයෙන් බලය භාවිතා කරන පාලකයන්ගේ බලය, පාලනය කිරීම පිළිබඳ ව්‍යවස්ථානුකුල සංස්කෘතික ලෙස සලකනු ලැබේ.

<u>ව්‍යවස්ථානුකුලවාදයේ අන්තර්ගතය</u>

අ) මෙය පාලකයන්ගේ සහ රාජ්‍ය නිලධාරීන්ගේ අත්තනෝමතික තීරණවලට එරෙහි වන්නකි.

ආ) දේශපාලන සමාජයේ පාලකයන්ට සහ නිලධාරීන්ට තමන් කැමැති ඕනෑම දෙයක් තමන්ගේම ක්‍රමයක් යොදා භාවිතා කිරීමට ඔවුන්ට නිදහස නැත යන අදහස අවධාරණය කරයි.

ඇ) පාලකයන් සහ නිලධාරීන් ව්‍යවස්ථාවෙන් නියම කරන සංවරණයන් සහ ක්‍රමයන් අනුගමනය කරමින් තමන්ට හිමි බලය ක්‍රියාත්මක කිරීමට බැඳී සිටී.

මෙලෙස ව්‍යවස්ථානුකූලවාදය පිළිබඳ පිළිබඳ සංකල්පයේ ප්‍රධාන තේමාවන් වන්නේ නීතිය යටතේ වූ සීමිත ආණ්ඩුව යන්නයි.

<u>ව්‍යවස්ථානුකූලවාදයේ මූලිකාංග</u>

ලුයිස් කෙනකින් සඳහන් කරන පරිදි ව්‍යවස්ථානුකූලවාදයේ පහත සඳහන් මූලිකාංග අන්තර්ගත වී ඇත.

- ව්‍යවස්ථානුකූල ආණ්ඩුව
- බලතල බෙදීම
- මහජන ස්වාධිපත්‍ය සහ ප්‍රජාතන්ත්‍රවාදී ආණ්ඩුව
- ව්‍යවස්ථා විවරණය
- අධිකරණයේ ස්වාධීනත්වය
- මානව අයිතිවාසිකම්වලට ගරු කරන සීමිත ආණ්ඩුව
- නීතිය හා සාමය පාලනයේ තබාගැනීම

## (05) දේශපාලන පක්ෂ

දේශපාලන පක්ෂ නූතන ප්‍රජාතන්ත්‍රවාදයේ අපූර්වතම සොයාගැනීමට වශයෙන් හඳුන්වනු ලැබේ. මක්නිසාද යත් නූතන ප්‍රජාතන්ත්‍රවාදයේ ක්‍රියාකාරිත්වය සඳහා දේශපාලන පක්ෂ අත්‍යවශ්‍ය වන බැවිනි. එනම් දේශපාලන පක්ෂ නොමැතිව නූතන ප්‍රජාතන්ත්‍රවාදය ක්‍රියාත්මක කළ නොහැකි වේ. නූතන ප්‍රජාතන්ත්‍රවාදී දේශපාලන ක්‍රමයන් හි දේශපාලන පක්ෂ විසින් ඉටුකරනු ලබන කාර්යයභාරය අතිශයින් පුළුල් වේ. එකී කාර්යයන් පහත සඳහන් පරිදි වේ.

- මහජනතාව හා ආණ්ඩුව අතර සම්බන්ධතා ඇති කිරීම
- ප්‍රතිපත්ති සම්පාදනය හා ක්‍රියාත්මක කිරීම
- මහජන මතය සංවිධානය කිරීම
- මිනිස් නිදහස හා අයිවාසිකම් ආරක්ෂා කිරීම
- ජනතාවගේ දේශපාලන අවබෝධය පුළුල් කිරීම
- දේශපාලන නායකයින් පුහුණු කිරීම
- දේශපාලන නවීකරණය

## (06)බලතල බෙදීම

බලතල බෙදීම යනු නීති පැනවීම, ඒවා ක්‍රියාත්මක කිරීම සහ අධිකරණ තීන්දු ලබාදීම යන ආණ්ඩුවක ප්‍රධාන ත්‍රිවිධ කාර්යයන් ඉටු කිරීම සඳහා ඒවා පිළිවෙලින් ව්‍යවස්ථාදායකය, විධායකය සහ අධිකරණ යන ආයතනවලට පවරා දීම අවධාරණය කරන න්‍යාය වේ.

### බලතල බෙදීම පිළිබඳ න්‍යායාත්මක පදනම

1748 දී "නීතියේ සාරය" කෘතියෙන්ද මොනටෙස්කිව්ෂු මෙම න්‍යාය හඳුන්වා දී ඇත. බලතල බෙදීමේ න්‍යායට පහත සඳහන් මූලික අංග ලක්ෂණ පදනම් වී ඇත.

- ❖ රජයේ එක් එක් ආයතන වෙන් වෙන් ව ක්‍රියාකළ යුතුය.
- ❖ එක් ආයතනයක කාර්යය තවත් ආයතනයකින් සිදු නොකළ යුතුය.
- ❖ එක් ආයතනයක කටයුතු කරන පුද්ගලයන් තවත් ආයතනයක නොසිටිය යුතුය.
- ❖ එක් ආයතනයක තවත් ආයතනයක අනම්‍ය ලෙස නොවීම යුතු අතර පාලනයද නොකළ යුතුය.

නමුත් මොන්ටෙස්ක්‍යුගේ රජයේ ආයතන තුන අතරත් අධිකරණයේ ස්වාධිපතිත්වය අවධාරණය කළ අතර අවශ්‍ය වු විට ආයතන තුනම එකින් එකට සම්බන්ධ වී තම තමන්ගේ කාර්යයන් ඉතා හොඳින් ඉටු කළ හැකි බව සඳහන් කරයි. මෙලෙස මොන්ටෙස්ක්‍යුගේ බලතල බෙදීම පිළිබඳ න්‍යාය රජයේ ආයතන අතර අන්තර් සම්බන්ධතාවය අනුමත කරයි.

### බලතල බෙදීම න්‍යායේ භාවිතාව

බලතල බෙදීමේ න්‍යාය ලෝකයේම පළමුයෙන් ම ප්‍රායෝගික තත්ත්වය ව්‍යවස්ථාවෙන් හිමිකර දුන් රට වන්නේ ඇමෙරිකානු එක්සත් ජනපදයයි. ඇමෙරිකාවේ මෙම න්‍යාය නිසි ලෙස පිළිපදිනු ලබන අතර මෙහි ප්‍රායෝගික තත්ත්වය සහතික කිරීමක් ලෙස සංවරණය හා තුලන ක්‍රමය ස හඳුන්වා දී ඇත. එබැවින් ඇමරිකානු ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ මෙම න්‍යායට වැදගත් තැනක් ලබාදී ඇත.

නමුත් අනෙකුත් රටවල විශේෂයෙන් සියලු ලිබරල් ප්‍රජාතන්ත්‍රවාදී රටවල අධිකරණ ස්වාධීනත්වය යන සංකල්පය මඟින් මෙම න්‍යාය විවිධ ලෙස භාවිතා කරනු ලැබේ.

## (07) ස්වාධිපති න්‍යාය

මෙම න්‍යාය පිළිබඳ සාකච්ඡා කිරිමේදී

1. ස්වාධිපති න්‍යාය යනුවෙන් අදහස් වන්නේ කුමක්ද
2. මෙම න්‍යාය බිහිවීමට බලපෑ සමාජ දේශපාලන පරිසරය හඳුනා ගැනීම
3. මෙම න්‍යාය ඉදිරිපත් කළ ප්‍රධාන චින්තකයින්ගේ අදහස්
4. මෙම න්‍යාය පිළිබඳ ඉදිරිපත්වී ඇති විවේචන.

රාජ්‍ය බලය පිළිබඳ අධ්‍යයනය කරන න්‍යාය ස්වාධිපති න්‍යාය වේ. මානව සමාගම් අතරින් රාජ්‍ය නැමැති සමාගමට හිමිවන ලක්ෂණ අතුරින් ප්‍රධාන ලක්ෂණය වන්නේ ස්වාධිපත්‍යයි. කෙටියෙන් ප්‍රකාශ කරනවානම් ජාතික රාජ්‍යය සතු බල අධිකාරිය හා එය ක්‍රියාවට නංවන ආකාරය ස්වාධිපති න්‍යාය මගින් විස්තර කරනු ලැබේ.

16 වන සියවසේ ආරම්භයේදී පාප් අධිරාජ්‍ය බිඳ වැටීමෙන් පසු බිහිවූ ජාතික රාජ්‍යය බලය තහවුරු කිරීමට මෙම න්‍යාය ඉදිරිපත් කරන ලදි. මෙම න්‍යායෙන් ප්‍රකාශ වන්නේ බලය උත්තරීතරය, ඒකීයවේ, සීමාවන් පැනවිය නොහැකිය, පැවරිය නොහැකිය, නීතිය වූ කලී ස්වාධිපතිගේ විධානයයි.

මෙම සංකල්පයේ ප්‍රධාන චින්තකයා වන්නේ ප්‍රංශ ජාතික ජීන් බොඩැන්ය. දෙවනුව මෙම සංකල්පය පිළිබඳ අදහස් වන්නේ හියුගෝ ගෝෂස්ය. ඒ ඔහු විසින් 1625 දී රචනා කරන ලද ජාත්‍යන්තර නීතිය කෘතිය මගිනි. තෙවනුව මෙම න්‍යාය පිළිබඳ අදහස් දක්වන්නේ තොමස් හොබ්ස්ය ඒ 1651 දී ඒ ලෙවියාතාන් කෘතිය මගිනි. මිළඟට ජොන් ලොක් 1691 දී ප්‍රකාශ කරන ලද සිවිල් ආණ්ඩුව පිළිබඳ සම්මුතීන් දෙකක් යන කෘතිය තුළිනි. අනතුරුව රූසෝ විසින් 1676 දී ප්‍රකාශයට පත් කරන ලද සමාජ සම්මුතිය කෘතිය තුළින් මේ පිළිබඳ අදහස් ඉදිරිපත් කර ඇත.

## විවේචන

මෙම සංකල්පය යල්පැනගොස් ඇත. තවද හැරල්ඩ් ජේ ලැස්කි ප්‍රකාශයට පත් කරන ආකාරයට ස්වාධිපති න්‍යාය දේශපාලන විද්‍යාවේ බෙහෙවින් විවාදාත්මක සංකල්පයක් වේ. තවද මැක් අයිවර් ප්‍රකාශ කරන ආකාරයට නූතනයට වලංගු නොවේ. සමස්ථයක් ලෙස ගත් විට මෙම සංකල්පයෙන් ප්‍රකාශ වන රාජ්‍යය බලය බෙදීය නොහැකිය උත්තරීතර වේ,බෙදිය නොහැකිය ,පැවරිය නොහැකිය, සීමා කළ නොහැකිය යන පිළිගැනීම් නූතන ජාතික රාජ්‍යයට එතරම්ම වංගු නොවේ. හේතුව මෙම සංකල්පයෙන් විග්‍රහ කරන කරුණු පිළිබඳ විශ්ලේෂණය කරන විට පැහැදිලි වන්නේ ජාතික හා ජාත්‍යන්තර සාධක සමූහයක් මගින් සංකල්පීය කරුණු සීමා කොට ඇති බවයි.